සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 12, Second Term Test, March 2020**

**භූගෝල විද්‍යාව - I**

**Geography - I**

22 | S | I

පැය 02 යි

**Time: 02 hours**

**උපදෙස් :**

**මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විතය.**

- **I කොටස බහු වරණ ප්‍රශ්න 40 කින් සමන්විත වේ. එම ප්‍රශ්න වලට අදාළ පිළිතුර අඩංගු අංකය වරහන තුළ යොදන්න.**
- **I කොටසේ නිවැරදි පිළිතුරක් සඳහා එක ලකුණ බැගින් හිමිවේ.**
- **II හා III කොටස් වල ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ.**
- **I, II සහ III කොටස් වල පිළිතුරු පත්‍ර එකට අමුණා භාරදිය යුතුය.**

## I කොටස

01. 1 : 25,000 පරිමාණයට ඇඳි භූ ලක්ෂණ සිතියමක සෙන්ටිමීටර 12 කින් දැක්වෙන සැබෑ භූමියේ දුර ප්‍රමාණය වන්නේ,

i. 3 Km ii. 4 Km iii. 2 Km iv. 8 Km ( )

02. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියට (GPS) යොදා ගනු ලබන තාක්ෂණික ක්‍රමවේදය වන්නේ,

i. බිම්මැනුම් ii. පරිගණක iii. නිරීක්ෂණ iv. චන්ද්‍රිකා ( )

03. භූගෝලීය තොරතුරු පද්ධතිය තුළ ප්‍රතිදාන උපාංගයක් වන්නේ,

i. චුම්බක තැටි ii. අංකන ඵලකය iii. සංදර්ශකය iv. සුපිරික්සන ( )

04. භූගෝලීය තොරතුරු පද්ධතියක මූලික සංරචක,

i. 4 කි. ii. 3 කි. iii. 5 කි. iv. 2 කි. ( )

05. යම් කිසි ස්ථානයක නිවැරදි පිහිටීම සොයා ගත හැකි නව තාක්ෂණික සිතියම් විද්‍යාත්මක ක්‍රමවේදය වන්නේ,

i. ගෝලීය තොරතුරු පද්ධතිය
ii. දුරස්ථ සංවේදන පද්ධතිය
iii. බිම් මැනුම්කරණය
iv. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය ( )

06. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ,

i. ඇමෙරිකා එක්සත් ජනපදයේ ය. ii. කැනඩාවේ ය.

iii. බ්‍රසීලයේ ය. iv. ආජන්ටිනාවේ ය.

( )

07. භූගෝලීය තොරතුරු පද්ධතියක අඩංගු දත්ත ගබඩා කිරීමේ ක්‍රමයක් වන දෛශික දත්ත ආකෘතියේ දී,

i. සියලුම දත්ත ලක්ෂ්‍ය මගින් ඉදිරිපත් කරයි.

ii. සියලුම භූගෝලීය ලක්ෂණ ලක්ෂ්‍ය, රේඛා, කලාප නැතිනම් බහු - අශ්‍ර මගින් ඉදිරිපත් කරයි.

iii. සිතියම් ප්‍රදේශය තීරු හා පේළි ලෙස ඉදිරිපත් කරයි.

iv. සිතියම් ප්‍රදේශයකට සංඛ්‍යාත්මක වටිනාකමක් දී ලක්ෂ්‍ය හා තීරු ලෙස ඉදිරිපත් කරයි.

( )

08. දුරස්ථ සංවේදයේ දී භාවිතා කරන සංවේද වේදිකා වන්නේ,

i. සංවේද වේදිකා, ගුවන් ඡායාරූප, සිතියම්

ii. භූමිපාදක වේදිකා , වාසර වේදිකා , අභ්‍යවකාශ වේදිකා

iii. චන්ද්‍රිකා, ගුවන්ඡායාරූප, ඩ්‍රෝන කැමරා

iv. අභ්‍යවකාශ වේදිකා , පාලක, පරිශීලක

( )

09. ගෝලීය ස්ථාන ගත කිරීමේ පද්ධතියේ චන්ද්‍රිකා තොරතුරු ලබා ගැනීම සඳහා ලොව පුරා පිහිටුවා ඇති මෙහෙයුම් මධ්‍යස්ථාන ගණන,

i. 4 කි. ii. 3 කි. iii. 2කි. iv. 1කි.

( )

10. පහත සඳහන් දෑ අතුරෙන් අවකාශීය දත්ත සඳහා නිදසුනක් වන්නේ,

i. විශේෂිත කරුණක් සඳහා ගත වූකාලය

ii. නගරයක මුළු ජන සංඛ්‍යාව

iii. කිසියම් ජලාශයක ජලයේ ගුණාත්මක බව

iv. සමෝච්ඡ රේඛා ව්‍යාප්තිය

( )

11. භෞම පද්ධතිය තුළ ඇති උප පද්ධතීන් අතර මනා සම්බන්ධය දැක්වීමට හොඳම නිදසුන වන්නේ,

i. ජල චක්‍රය ii. කාබන්චක්‍රය iii. ඔක්සිජන් චක්‍රය iv. පාංශු චක්‍රය

( )

12. පෘථිවි ව්‍යුහයේ ප්‍රාවරණයට සමස්ථ පෘථිවි පෘෂ්ටයෙන්,

i. 1/2 ක් අයත්වේ. ii. 2/3 ක් අයත්වේ.

iii. 1/4 ක් අයත්වේ. iv. 2/5 ක් අයත්වේ.

( )

13. ආම්ලික ආග්නේය පාෂාණ වර්ගයට නිදසුනක් වන්නේ,

i. ගැබ්රෝ ii. ග්‍රැනයිට් iii. ඇන්ඩිසයිට් iv. පොරිඩොටයිඩ්

( )

14. විපරිත පාෂාණයකට නිදසුනක් වන්නේ,

i. ග්‍රැනයිට් ii. හුනු ගල් iii. නයිස් iv. වැලිගල්

( )

15. ලංකාවේ විශාලතම ඛණිජ වැලි නිධිය පිහිටා ඇත්තේ,

i. නිලාවේලි ii. නයාරු iii. මුලතිව් iv. පුල්මුඩේ

( )

16. අපසාරී චලන හේතුවෙන්,

i. නැමි කඳු ඇතිවේ. ii. නව සාගරික පතුල් නිර්මාණය වේ.

iii. අගාධ නිර්මාණය වේ. iv. විභේද ඇති වේ.

( )

17. සම්පීඩන චලන හේතුවෙන් නිර්මාණය වූ භූ රූපයක් වන්නේ,

i. හිමාලය කඳු ii. අප්‍රිකානු සුවිභේද නිම්නය

iii. මරියානාආගාධය iv. මධ්‍ය අත්ලන්තික් වැටිය

( )

18. ආක්‍රාන්ත යමහල් භූ රූපයකි,

i. යමහල්කේතු ii. ලාවා සානු iii. ඩයික iv. කල්දේරාව

( )

19. ඕල්ඩ්ෆේත් ඵුල් ගීසරය පිහිටා ඇත්තේ,

i. බ්‍රසීලයේ ය. ii. ඇමෙරිකා එක්සත් ජනපදයේ ය.

iii. එක්සත් රාජධානියේ ය. iv. ප්‍රංශයේ ය.

( )

20. ගංගාවක ආරම්භයේ සිට අවසානය තෙක් දික් පැතිකඩක් ප්‍රධාන කොටස්,

i. තුනකට බෙදේ. ii. හතරකට බෙදේ.

iii. දෙකකට බෙදේ. iv. පහකට බෙදේ.

( )

21. යෞවන අවස්ථාවේ ගංගාවක,

i. බෑවුම අඩු ය. ii. ජල ප්‍රමාණය වැඩි ය.

iii. ඛාදනය වේගවත් ය. iv. ගංගාවේ පළල වැඩි වේ.

( )

22. ගංගාවක වෘද්ධ අවස්ථාවේ ඇති වන භූ රූපයකි.

i. V හැඩ නිම්න ii. ගල්වන

iii. දිය ඇලි iv. ඩෙල්ටාව

( )

23. සුළං ඛාදනය වඩාත් ප්‍රබල වන්නේ,

i. වෙරළ ප්‍රදේශවල ය. ii. හුනු ගල් ආශ්‍රිත ප්‍රදේශවල ය.

iii. කාන්තාර ප්‍රදේශවල ය. iv. ගං ඉවුරුවල ය.

( )

24. සුළං ඛාදනය සිදු වන එක් ආකාරයකි.

i. අවලම්බනය ii. අපහරණය

iii. පිනුම් ගමන iv. පෙරළි ගමන

( )

25. කාන්තාර ප්‍රදේශවල සියුම් වැලි, දූවිලි අංශු සුළඟ මගින් ඉහළින් රැගෙන යාම,

i. පිනුම් ගමනයි. ii. පෙරළි ගමනයි.

iii. උල්ලේඛයයි. iv. අවලම්බනයයි.

( )

26. සුළං ඛාදන ක්‍රියාවලියේ දී සංඝර්ෂණය යනු,

i. අපහරණය වන ද්‍රව්‍ය පාෂාණ ස්කන්ධවල ගැටී ඛාදනය කිරීමයි.

ii. සුළඟින් රැගෙන යන ද්‍රව්‍ය මගින් පොළව මතුපිට සීරී යාමයි.

iii. සුළඟ මඟින් ද්‍රව්‍ය ඔසවා ගෙන යාමයි.

iv. පාෂාණ කොටස් පොළව මතුපිටින් ගලවා දැමීමයි.

( )

27. සුළං ක්‍රියාවලියේ නිධි සාධිත භූ රූපයකි.

i. වාමට ගැට ii. වැලිවැටි iii. යාඩෑම් iv. ගවුර

( )

28. කාන්තාර ප්‍රදේශවලට ඇද හැලෙන වර්ෂාපතනය නිසා නිර්මාණය වන භූ රූපයක් වන්නේ,

i. ප්ලායාවල් ii. අපහරණ ද්‍රෝණි

iii. බාර්කන් iv. ලොයෙස්නිධි

( )

29. 2017 වර්ෂයේ ජුනි මාසය වන විට ලෝක ජනගහනය වූයේ,

i. බිලියන 8 කි. ii. බිලියන 7.5 කි. iii. බිලියන 7 කි. iv. බිලියන 6.5 කි.

( )

30. ජනසංඛ්‍යා වර්ධනයක් ඇතිවන්නේ,

i. උපත් සංඛ්‍යාව වැඩි වීමෙනි.

ii. උපත් සංඛ්‍යාවට වඩා මරණ සිදු වීමෙනි.

iii. උපත් සංඛ්‍යාවට වඩා මරණ සංඛ්‍යාව අඩු වීමෙනි.

iv. උපත් සංඛ්‍යාව හා මරණ සංඛ්‍යාව සමාන වීමෙනි.

( )

31. ජන සංඛ්‍යාව පිළිබඳ ව ඓතිහාසික දත්ත විමසීමේ දී ජන සංඛ්‍යා වර්ධනයේ කැපීපෙනෙන අවධි,

i. තුනකි. ii. දෙකකි. iii. හතරකි. iv. පහකි.

( )

32. ජන සංඛ්‍යාවේ ගතිකත්වයට බලපාන සාධකයක් නොවන්නේ,

i. උපත් ii. මරණ iii. ස්ත්‍රී-පුරුෂ බව iv. සංක්‍රමණ

( )

33. පහත දැක්වෙන ජන සංඛ්‍යා පිරමීඩ මඟින් පිළිවෙළින් ජන සංඛ්‍යාවේ කුමන අවස්ථාවන් පෙන්නුම් කරයිද?



i. ස්ථාවර, හායන, ප්‍රසාරණ

ii. හායන, ප්‍රසාරණ, ස්ථාවර

iii. ප්‍රසාරණ, ස්ථාවර, හායන

iv. ප්‍රසාරණය, හායන, ස්ථාවර

( )

34. A - ළමා ජනගහනය අධික ය.

B - වයස්ගත ජනගහනණය අධික ය.

ඉහත ප්‍රකාශ සඳහා වඩාත් ගැළපෙන ජන පිරමීඩ වර්ග දෙක කුමක් ද?

i. ප්‍රසාරණ, හායන

ii. හායන, ප්‍රසාරණ

iii. ප්‍රසාරණ, ස්ථාවර

iv. ස්ථාවර, හායන

( )

35. ශ්‍රී ලංකාවේ සංක්‍රමණික ජන සංඛ්‍යාව තුළ,

i. ළමා ජන සංඛ්‍යාව වැඩිය.

ii. තරුණ ජන සංඛ්‍යාව වැඩිය.

iii. ශ්‍රම බලකාය වැඩිය.

iv. වයස්ගත ජන සංඛ්‍යාව වැඩිය.

( )

36. ''ජනාවාසයක් යනු පොළෝ තලයේ මිනිසා විසින් ගොඩ නඟන ලද වාස භූමියකි.''මෙම නිර්වචනය ඉදිරිපත් කළේ,

i. ඇරිස්ටෝටල් ය.

ii. හම්බෝල්ට් ය.

iii. මිලර් ය.

iv. ඩිකින්සන් ය.

( )

37. කොළඹ පුරවරයට අයත් ප්‍රධාන උප නගර තුන වන්නේ,

i. කොළඹ, කළුතර, ගම්පහ

ii. කොළඹ, හෝමාගම, මහරගම

iii. කොල්ලුපිටිය, මොරටුව, රත්මලාන

iv. මහරගම, කළුතර, ගම්පහ

( )

38. කිසියම් ලක්ෂයක් හෝ ස්ථානයක් හෝ කේන්ද්‍ර කර ගනිමින් ඒකරාශි නොවූ ජනාවාසයකි.

i. ආකීර්ණ ජනාවාස

ii. සවිධි ජනාවාස

iii. නාභිගත ජනාවාස

iv. විකීර්ණ ජනාවාස

( )

39. සැලසුම්ගත ජනාවාසයක් නොවන්නේ,

i. මහවැලි ගම්මාන

ii. උදා ගම්මාන

iii. රණවිරු ගම්මාන

iv. වෙරළබඩ ජනාවාස

( )

40. ගම හා නගරය අතර පිහිටි සංක්‍රාන්තික කලාපය හඳුන්වන්නේ,

i. නාගරික ජනාවාසයක් ලෙසය.

ii. ගැමිරික ජනාවාසයක් ලෙසය.

iii. වතු ජනාවාසයක් ලෙසය.

iv. ග්‍රාමීය ජනාවාසයක් ලෙසය.

( )

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

General Certificate of Education (Adv. Level), Grade 12, Second Term Test, March 2020

භූගෝල විද්‍යාව - II

Geography - II

22 S II

පැය 03 යි

Time: 03 hours

**II - පත්‍රය**

**උපදෙස් :**

**මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තය. එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරා ගෙන ප්‍රශ්න 5 කට පිළිතුරු ලියන්න.**

## I - කොටස - භෞතික භූගෝල විද්‍යාව

01. i. භෞම පද්ධතියේ උප පද්ධති නම් කරන්න. (ල.02)
 ii. ජෛව ගෝලයේ සංවිධාන මට්ටම් පිළිබඳ විස්තර කරන්න. (ල.06)
 iii. භෞම පද්ධතියේ තුලිතතාව බිඳ වැටීමට බලපාන සාධක පිළිබඳ විග්‍රහයක යෙදෙන්න. (ල.06)
 iv. භෞම පද්ධතියේ තුලිතතාවය රැක ගැනීමේ ඇති වැදගත්කම පහදන්න. (ල.06)

02. i. භූමි කම්පා ඇති වන ප්‍රධාන කලාප 2 ක් නම් කරන්න. (ල.02)
 ii. භූමි කම්පාවක් ඇති වන ආකාරය රූප සටහන් ආධාරයෙන් විස්තර කරන්න. (ල.06)
 iii. ආක්‍රාන්ත යමහල් භූ රූප නිර්මාණය රූපසටහන් 3 ක් ඇසුරින් පහදන්න. (ල.06)
 iv. නිෂ්ක්‍රාන්ත යමකම ක්‍රියාවලිය පහදා එයින් ඇති වන භූ රූප තුනක් විස්තර කරන්න. (ල.06)

03. i. බහිර්ජනණය ජන්‍ය සාධක 4 ක් නම් කරන්න. (ල.02)
 ii. ගංගාවක දික් පැතිකඩක් ඇඳ එහි අවස්ථා පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල.06)
 iii. ගංගා ඛාදනය කෙරෙහි බලපාන සාධක දක්වා ගංගා ඛාදනය වේගවත් කරන මානුෂ සාධක පිළිබඳ විග්‍රහ කරන්න. (ල.06)
 iv. ගංගාවක වෘද්ධ අවස්ථාවේ ඇති වන භූ රූප 3 ක් රූප සටහන් ඇසුරින් පහදන්න. (ල.06)

04. i. සුළං බාදනය සිදුවන ආකාර තුන නම් කරන්න. (ල.02)

ii. සුළං බාදිත භූ රූප 3 ක් රූප සටහන් ඇසුරින් පහදන්න. (ල.06)

iii. කාන්තාර ප්‍රදේශ වල ජලයෙන් ඇති වන භූ රූප 3 ක් පිළිබඳ විස්තර කරන්න. (ල.06)

iv. සුළං ක්‍රියාවලියේ නිධි සාධිත භූ රූප 3 ක් පහදන්න. (ල.06)

## II - කොටස

05. i. ලෝක ජන සංඛ්‍යාව යන්න නිර්වචනය කරන්න. (ල.02)

ii. ලෝක ජනසංඛ්‍යා වර්ධනයේ ප්‍රධාන අවධි නම් කර අධික ජන සංඛ්‍යා වර්ධනයක් ඇතිවීමට බලපාන සාදක විස්තර කරන්න. (ල.06)

iii. ලෝක ජන සංඛ්‍යාව ආශ්‍රිතව මතු වී ඇති ගැටලු 3 ක් විග්‍රහ කරන්න. (ල.06)

iv. රටක ජනභායනයක් ක් අනාගතය කෙරෙහි ඇති කරන බලපෑම විස්තර කරන්න. (ල.06)

06. i. ජන විද්‍යාත්මක සාධක නම් කරන්න. (ල.02)

ii. සංවර්ධිත රටවල හා සංවර්ධනය වෙමින පවතින රටවල් අතර ජන සංඛ්‍යා වර්ධනයේ කැපී පෙනෙන වෙනස්කම් පහදන්න. (ල.06)

iii. සංක්‍රමණයක් යන්න නිර්වචනය කර සංක්‍රාමණ කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙකක් විස්තර කරන්න. (ල.06)

iv. සංක්‍රමන නිසා ගමනාන්ත රටවල මුහුණ දෙන සෘණාත්මක ප්‍රතිඵල3ක් පිළිබඳ විස්තර කරන්න. (ල.06)

07. i. ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තියට බලපාන භෞතික සාධක 2 ක් නම් කරන්න. (ල.02)

ii. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව ආශ්‍රිත ගැටලු 2 ක් විස්තර කරන්න. (ල.06)

iii. ග්‍රාමීය ජනාවාස රටා දෙකක් නිදසුන් ඇසුරින් පැහැදිළි කරන්න (ල.06)

iv. බාහිර සංක්‍රමණ නිසා ශ්‍රී ලංකාව මුහුණ දී ඇති ගැටළු 3ක් පහදන්න. (ල.06)

08. i. ජනාවාසයක මූලිකාංග 4 ක් නම් කරන්න. (ල.02)

ii. මානව ඉතිහාසයේ මේ දක්වා ජනාවාස විකාශය වූ ආකාරය පැහැදිලි කරන්න. (ල.06)

iii. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සංක්‍රමණ කෙරෙහි බලපා ඇති සාධක 3 ක් විස්තර කරන්න. (ල.06)

iv. නාගරික ජනාවාසයක් තුළ දැකිය හැකි සමාජීය ගැටළු 3 ක් විග්‍රහ කරන්න. (ල.06)

## II - කොටස

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කරන ලද 1:50000 පරිමාණයේ අම්බලන්ගොඩ භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ඡ රේඛා අන්තරය 20m කි.එම සිතියම පදනම් කර ගනිමින් පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවිය යුතුය.

සැලකියයුතුය,

* පිළිතුරු සිතියමෙහි ලිවියයුතු නොවේ.
* ප්‍රශ්න අංකයහා අදාළ උප කොටස් වල අංක පිළිතුරු පත්‍රයේ පැහැදිළි ව සඳහන් කළ යුතුය.
* සිතියම ඔබේ පිළිතුරු පත්‍රයට ඇමිණිය යුතු නොවේ.

01.
- i. A හා B අක්ෂර වලින් දැක්වෙන භූ විෂමතා ලක්ෂණ දෙක නම් කරන්න. (ල.02)
- ii. සිතියම් ප්‍රදේශයේ නැගෙනහිර අර්ධය හරහා ගමන් කර ප්‍රදේශයෙන් පිටවන E01 මාර්ගයේ දුර කිලෝමීටර් කීය ද? (ල.02)
- iii. සිතියම් ප්‍රදේශයෙ ඇති මාර්ග වර්ග 3 ක් නම් කරන්න. (ල.03)
- iv. චතුරස්‍රයේ ඇති සංස්කෘතික ලක්ෂණ 3 ක් නම් කරන්න. (ල.03)
- v. ප්‍රදේශයේ භූ විෂමතාවය හා භෝග ව්‍යාප්තිය අතර ඇති සම්බන්ධතාවය පහදන්න. (ල.04)
- vi. සිතියම් ප්‍රදේශයේ ජනාවාස ව්‍යාප්තිය කෙරෙහි බලපා ඇති සාදක විමසන්න. (ල.04)
- vii. සිතියම් ප්‍රදේශය තුළ සාර්ථකව කළ හැකි කර්මාන්ත 2 ක් යෝජනා කරන්න. (ල.02)

02. ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘත සිතියමෙහි සම්මත සංකේත හා වර්ණ යොදා ගනිමින් පහත සඳහන් දෑ ලකුණු කරන්න.

- i. කර්කටක නිවර්තනය
- ii. ෆුජියාමා ගිනිකන්දපිහිටිරට
- iii. යුරෝපාසංගමයෙන් 2020 සිටඉවත්වූරට
- iv. එරල්මුහුද
- v. ආක්ටික්සාගරය
- vi. තාර් කාන්තාරය
- vii. ඇන්ඩීස්කඳුවැටිය
- viii. හොවැංහෝනදිය
- ix. ඕෂනියාමහද්වීපය
- x. බයිකල් විල

(ල.10)

## III - කොටස

03. i. නූතන සිතියම් විද්‍යාත්මක ක්‍රම 3 ක් නම් කරන්න. (ල.03)

ii. තේමා සිතියමකින් ඇති ප්‍රයෝජන 3 ක් ලියන්න. (ල.03)

iii. භූ ලක්‍ෂණ සිතියමක ප්‍රයෝජන 4 ක් ලියන්න. (ල.04)

iv. "පැරණි සිතියම් ක්‍රම වලට වඩා නූතන සිතියම් විද්‍යාත්මක ක්‍රමඵලදායී වේ."පහදන්න. (ල.05)

04. i. GPS හෙවත් ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය යන්න නිර්වචනය කරන්න. (ල.03)

ii. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ ප්‍රධාන උපාංග 3 නම් කරන්න. (ල.03)

iii. ගෝලීය ස්ථානගත කිරීමේ තාක්‍ෂණය භාවිතා වන ක්ෂේත්‍ර පිළිබඳ විග්‍රහ කරන්න. (ල.04)

iv. භූ ගෝලීය තොරතුරු පද්ධතියේ වාසි අගයන්න. (ල.05)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Southern Provincial Department of Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 12, Second Term Test, March 2020**

භූගෝල විද්‍යාව Geography

# TOPOGRAPHICAL MAP - SRI LANKA 1:50,000 - SECOND EDITION



LOL.lk
Learn Ordinary Level

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර



• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams

සමනල දැනුම

විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank

Master Guide

WWW.LOL.LK

CASH ON DELIVERY

HOME DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

071 777 4440